**ශීර්ෂය - 151 ධීවර අමාත්‍යාංශය**

-----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ධීවර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| 2020 වර්ෂයේ 154 (6) විගණකාධිපති වාර්තාවට ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| ---------------- | ----------------------- | ----------- |
| **1.6.2** (ඇ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය ACA -6 පරීක්ෂා කිරීමේදී 2020 වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් එකතුව රු.81,787,561ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම් රු.81,982,353ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.194,792ක වෙනසක් විය. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| 1.6.4 | වසර 2 ක ඉක්ම වූ රු.1,625,268 ක තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | පරීක්ෂා කර බලා කල් ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | -------------------------------- | ----------- |
| ධීවර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ අවුරුදු 5 වැඩි තැන්පතු ශේෂය රු.1,227,112 ක් විය. එයින් රු. 555,553 ක රඳවා ගත් කොන්ත්‍රාත් තැන්පතු දෙකක් අවසන් බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් ද රු.671,559 ක රඳවා ගත් මුදල් කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ද රඳවාගෙන තිබුණු අතර එම ශේෂ නිරවුල් කර මුදල් රෙගුලාසි ප්‍රකාර රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවුරුදු 05ට වැඩි රු.1,227,112 ක තැන්පතු ශේෂය පිළිබඳ සැළකිල්ල යොමු කර කඩිනමින් කටයුතු කිරීමට ක්‍රියා කරන බව. | පරීක්ෂා කර බලා ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. |

### 1.6.2 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA-6) සඳහා ඉදිරිපත් කර තිබුණු SA 82 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වටිනාකම රු.71,020,869 ක් ලෙස දක්වා තිබිය දී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂය තුල මූලධන වත්කම් අත්පත් කරගැනීම් යටතේ රු.46,523,499 ක් දක්වා තිබුණු හෙයින් රු.24,497,370 ක වෙනසක් විය. | 2020 01.01 සිට 2020.08.31 දක්වා කාලය තුල ධීවර අමාත්‍යාංශය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති බවත් එම කාලය තුල මිලදීගෙන තිබුණු රු. 24,497,372 ක වත්කම් අමාත්‍යාංශය වෙත පවරා නොමැති බැවින්, ජර්නල් සටහනක් මගින් ආරම්භක ශේෂ ලෙස ධීවර අමාත්‍යාංශය වෙත 2021 වර්ෂයේදී පවරා ගැනීමට කටයුතු කළ බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.3 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට පැවත එන රු.6,400,000 ක්වූ ලංකා ධීවර සංස්ථාවේ නොපියවූ අග්‍රිම ශේෂයක් 2021 ජනවාරි 01 දිනට අමාත්‍යාංශ අග්‍රිම ගිණුම්වල පෙන්වා නොතිබුණු අතර 2021 පෙබරවාරි මස ශ්‍රී ලංකා රේගුව මගින් තැන්පත් කරන ලද රු.1,083,663 කින් එම හිඟ අග්‍රිමයෙන් කොටසක් පියවා තිබුණි. හිඟ ශේෂය ලෙස රු.5,316,337 ක් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 70 වාර්තාවේ දක්වා තිබුණි. මෙම නොපියවූ අග්‍රිමය පියවීම් කිරීමට ලංකා ධීවර සංස්ථාවෙන් රු.50,000 බැගින් 2021 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල අයකර ගත් රු.150,000 ක් භාණ්ඩාගාරයට යවා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හා ACA 4 අනුව නොපියවූ අග්‍රිම ශේෂය (7002-0-0-089-18) හෙළිදරව් කර නොතිබුණි. | මෙය 2010 වර්ෂයේ සිට පැවත එන අග්‍රිම ශේෂයක් බවත් අමාත්‍යාංශ ගිණුම් පොත් මගින් ඉදිරියට ගෙන ඒමක් සිදු නොවන අතර භාණ්ඩාගාර පොත් හරහා පියවීම සිදුවන බැවින් ලංකා ධීවර සංස්ථාව වරින් වර ලබාදෙන මුදල භාණ්ඩාගාරයට යැවීමෙන් මෙම හිඟ ණය ශේෂය පියවීමට කටයුතු කරන බව. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා සසඳා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හා ACA 4 හි නොපියවූ අග්‍රිම ශේෂය හෙළිදරව් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **(i)** | කලපු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ නයාරු, නන්දිකඩාල්, ආරුගම්බේ, ලංකා පටුන, මුන්දලම හා රැකව යන කලපු ගැඹුරු කිරීම හා පිරිසිදු කිරීම වෙනුවෙන් රු.මිලියන 335.37 ක් වෙන්කර තිබුණි. වර්ෂය අවසානයේ සියයට 5.9 කට සමාන රු.මිලියන 23.49 ක් පමණක් වැයකර තිබුණි. | මෙම පූර්ව සැලසුම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රසම්පාදනයන් ප්‍රමාද වූ අතර ඒ හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වූ බව. | පූර්ව සැලසුම් කටයුතු හා ප්‍රසම්පාදනයන් ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |
| **(ii)** | බලපිටිය ධීවර වරායේ ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වියදම රු.1,030,216 ක් වූ අතර මුල් ප්‍රතිපාදනය හා සැසඳීමේ දී සියයට 0.34 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ලබා තිබුණි. ඒ අනුව අපේක්ෂිත කාර්යයන් ඉටුකර නොතිබුණු හෙයින් භෞතික ප්‍රගතිය ද මන්දගාමී විය. | එම කාර්යයන් කෙරෙහි කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්වය බලපාන ලද අතර එමඟින් කාර්යයන් මන්දගාමී වූ බව. | ප්‍රමාදයකින් තොරව අපේක්ෂිත කාර්යයන් ඉටුකළ යුතුය. |
| **(iii)** | මීගමුව කලපුව සංවර්ධනය කිරීම යටතේ අලුත් ජැටි පහසුකමක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 145 ක ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණ ද මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් අනුව රු.71,500,000 ක් වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවලට මාරුකර තිබුණි. ඒ අනුව ශුද්ධ ව්‍යාපෘති ප්‍රතිපාදනය රු.73,500,000 ක්වූ අතර ව්‍යාපෘති වියදම රු.11,095,602 ක් ලෙස දක්වා තිබුණි. තව ද අමාත්‍යාංශය පවත්වාගෙන තිබුණු වැය ලෙජරය අනුව එම ව්‍යාපෘති කටයුතු සඳහා කිසිදු මුදලක් වැයකළ බවට තොරතුරු ලෙජරයේ සටහන් කර නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්ම මත පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව ද භෞතික ප්‍රගතිය ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පැවරූ නඩුව හේතුවෙන් එකඟතාව ලබා නොදුන් අතර නීතිමය ගැටළුවක් පැන නොනගින බව 2021.09.06 දිනැති ලිපියෙන් නීතිපති විසින් දැන්වීමෙන් අනතුරුව ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව සිය අනුමැතිය ලබා දෙන බව දන්වන ලද බවත් 2021.11.03 දින එම ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කරන ලද අතර එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලබා දී නැති බවත් මෙම අනපේක්ෂිත ක්‍රියාවලිය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අවසන් නොකරන ලද බවත් වාර්තා කර ඇත. | පූර්ව සැලසුම් කටයුතු හා ප්‍රසම්පාදනයන් ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගන්නා ලද රු.169,500,000 ක ප්‍රතිපාදනවලින් වර්ෂය තුළ දී රු.20,652,381 ක් පමණක් වැයකර තිබුණෙන් රු.148,847,619 ක ඉතිරියක් වූ අතර මුදල් රෙගුලාසි මාරුකිරීම යටතේ ප්‍රතිපාදනය හා සැසඳීමේ දී ඉතිරියේ ප්‍රතිශතය සියයට 88 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ. | | |
| (i) | ඉකුත් වර්ෂවල සිට කළමැටිය ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ක්‍රියාත්මක වී තිබුණ ද ඒ සඳහා මූලික වියදම් ඇස්තමේන්තුවක් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි මූලික අදියරේ සැලසුම් කරන ලද සියළුම වැඩ කටයුතු එහි අනුමත ඇස්තමේන්තු සීමාව තුළ අවසන් කරන ලද අතර අතිරේකව ඉටු කළ යුතු බවට ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම් ඇතුළු කණ්ඩායමක් විසින් 2021.01.15 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී ධීවරයින්ගේ ඉල්ලීම් අනුව හඳුනා ගන්නා ලද බව. | වියදම් ඇස්තමේන්තු තාත්විකව සිදු කළ යුතුය. |
| (ii) | මූලික විමර්ශනය හා ශක්‍යතා අධ්‍යයන වැය විෂයය යටතේ රු.8,177,173 ක් වැය කර තිබුණ ද ඊට අදාල ගෙවීම් වවුචර්, ගෙවූ මුදල ආදී විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. | එම විස්තර හා වවුචරපත් විස්තර ඉල්ලීම පරිදි විගණනයට ඉදිරිපත් කළ හැකි බව. | මුදල් රෙගුලාසි අනුව ගෙවීම් වවුචර්, ගෙවූ මුදල ආදී විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | තව ද උක්ත වැය විෂයය යටතේ වූ රු.8,322,827 ක ඉතිරියෙන් රු.6,500,000 ක ඉතිරිය සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසි අනුව සිදුකළ මාරුකිරීමක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | වියදම් ඇස්තමේන්තු තාත්විකව සිදු කළ යුතුය. |
| (ඇ) | රු.4,177,250,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන මුදලින් සියයට 24.3 කට සමාන රු.1,019,145,349 ක් ඉතිරි වී තිබුණු අතර එයින් ද වැය විෂයයන් 11 ක සියයට 53 සිට සියයට 96 දක්වා පරාසයක රු.239,264,700 ක ඉතිරිවීම් ද වැය විෂයයන් දෙකක සියයට 100 ක ඉතිරිවීම් ද තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ බව. | -එම- |
| (ඈ) | ධීවර අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නාරා ආයතනය වෙත රු.20,278,000 ක් ලබා දී තිබුණු අතර එයින් රු.12,042,841 ක් වැය කර තිබුණි. ජූලි මාසයේ දී ලබා දී තිබුණු රු.15,378,000 ක | 2021 වර්ෂය රට තුළ පැවති කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් රාජ්‍ය ආයතනයන්හි දෛනික රාජකාරී පවත්වාගෙන යාමට නොහැකි වීම යනාදී හේතූන් නිසා එම ව්‍යාපෘතිවලට | ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරකම් නියමිත කාල රාමුවට අනුව ක්‍රියාත්මක |

| | | | |
|---|---|---|---|
| | මුදල මාස 5 ක් ගතවීමෙන් පසුව ද සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබූ අතර වැය කළ මුදලට අදාල වියදම් විස්තර ඉදිරිපත් කර නොතිබියදී නැවත රු.4,900,000 ක් නාරා ආයතනයට ලබා දී ඇති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය. | අදාල ක්‍රියාකාරකම් නියමිත කාල රාමුවට අනුව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවට එම ආයතනය විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනැති අංක 07/2020 දරන අයවැය චක්‍රලේඛයේ 07 ඡේදය අනුව මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ පුනරාවර්තන වියදම් යටතේ වන වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමේ දී අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කරන ලද මාරු කිරීම්වලට අදාල ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක වාර්තා මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වේ. එහෙත් ලේකම්වරයා විසින් කරන ලද මාරුකිරීම් අවස්ථා 8 ක් සම්බන්ධයෙන් ධීවර අමාත්‍යාංශය විසින් එවැනි වාර්තාවක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ බවට තොරතුරු ඉදිරිපත් නොවීය. | පුනරාවර්තන මාරු කිරීම්වලට අදාල විස්තර එම මාරු කිරීම සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ම ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | මුදල් රෙගුලාසි 12(1) ඡේදය අනුව මූලධන වියදම් ඇස්තමේන්තු කිරීමේ දී මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සම්පූර්ණයෙන් පැහැදිලි කළ යුතුය. එහෙත් 2021 වර්ෂය සඳහා 2001 වැය විෂයය යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදමක් ඇස්තමේන්තු කර නොතිබියදී 2021 වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන පිවිසුම් දොරටුව අලුත්වැඩියාව වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුවක් සඳහා රු.15,300,601 ක් ගෙවා තිබුණි. | අතිරේක මහල් 03ක් ඉදිකිරීම, සනීපාරක්ෂක පද්ධතිය වැඩි දියුණු කිරීම, ලේඛනාගාර සහ වාහන නැවැත්වීමේ පහසුකම් වැඩි දියුණු කිරිම සහ අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල පිළිසකර කිරීම, තීන්ත ආලේප කිරීම, උද්‍යාන අලංකරණය ඇතුළු පිරිසැකැස්ම වැඩිදියුණු කිරීම යනාදි අදියර හතරකින් යුත් මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් මූලධන වත්කම් අත්පත් කරගැනීමේ වැය විෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර දී තිබුණි. ඒ අනුව අදාල වියදම් එම වැය විෂයට බැර කර ඇති බව. | වියදම් ඇස්තමේන්තු තාත්විකව සිදු කළ යුතුය. |

(උ) හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය විසින් රු.මිලියන 39.012 ක ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (ඎ) | **(i)** මෙම නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම ධීවර අමාත්‍යාංශයේ 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබූ ගම සමඟ පිළිසඳර වැඩ සටහනේ දී කඩිනමින් කළ යුතු කාර්යයක් වශයෙන් හඳුනා ගන්නා ලද හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම ප්‍රතිපාදන ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙන ලද බවත් මෙම කාර්ය ප්‍රමුඛ කාර්යයක් සේ සලකා ඉටු කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන ඉටුකරන ලද බව. | -එම- |
| | **(ii)** හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ධීවර අමාත්‍යාංශය සතු වත්කමක් ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් දක්වා තිබුණත් එය ධීවර අමාත්‍යාංශය සතු වත්කමක් ද නැද්ද යන්න පිළිබඳ සලකා බලා නොතිබුණි. තවද කලපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීමේ ප්‍රතිපාදනවලින් එම වියදම් දරා තිබූ බැවින් කලපු සංරක්ෂණ හා සංවර්ධනය කිරීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි. | -එම- | -එම- |
| | (iii) 2021 දෙසැම්බර් 23 දිනට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද මූල්‍ය හා භෞතික ප්‍රගති විස්තර අනුව මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 14 කට සමාන රු.මිලියන 5.5 ක් බවත් භෞතික ප්‍රගතිය සියයට 20 ක් බවත් 2021 වසර අවසන් වන විට වැඩ නිම කිරීමට සැලසුම් කර ඇති බවත් දක්වා තිබුණි. | මේ පිළිබඳව අදාල අමාත්‍යාංශයෙන් විමසා ඇති අත ඊට පිළිතුරු ලද වහාම ඉදිරිපත කරන බව. | මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------- | ------------- |
| මූල්‍ය ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනට සටහන (iii) බැදීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් එකතුව රු.226,496,035 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA-92 වාර්තාවේ බැදීම් හා | මූල්‍ය ප්‍රකාශනය අනුව 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ ශේෂය රු.223,584,930 ක් බව. | බැරකම් ප්‍රකාශනයේ ශේෂය නිවැරදිව ඉදිරිපත් කල යුතු අතර ප්‍රතිපාදන මත පමණක් වියදම් සඳහා බැදීම් ඇතිකර ගත |

| | | |
|---|---|---|
| බැරකම් එකතුව රු.227,727,740 ක් විය. ඒ අනුව රු.1,231,705 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනසට හේතු අනාවරණය කරගෙන නොතිබුණි. | | යුතුය. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනයේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා මු.රෙ.135 බලතල පැවරීම සිදුකර අමාත්‍යාංශයේ කටයුතු විගණන හා කළමනාකරණ කමිටු මඟින් අධීක්ෂණය කරනු ලබන බවත් ඊට අදාළව ගනු ලබන තීරණ එම කමිටුව හරහා විගණකාධිපති වෙත වාර්තා කරනු ලබන බවත් වර්ෂය ආරම්භයේ දී වාර්ෂික ඇස්තමේන්තු, ක්‍රියාකාරී සැලැස්ම , ප්‍රසම්පාදන සැලැස්ම , විගණන සැලැස්ම , මූල්‍ය බලතල පැවරීම සිදු කර පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බවත් කාර්තු වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති බවත් භාණ්ඩාගාර උපදෙස් පරිදි වාර්ෂික ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ධීවර අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයේ සටහන (viii) ට අනුව උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘති බැංකු ගිණුම් අංක 7040777 යටතේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය ද බැංකු ප්‍රකාශයට අනුව එදිනට බැංකු ශේෂය ද රු.48,700 ක් වී තිබුණි.<br>මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ. | | |

| | | |
|---|---|---|
| (අ) ධීවර අමාත්‍යාංශය විසින් ධීවර වරාය, නැංගුරම්පොළ හා ගොඩබෑමේ ස්ථාන සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් පවත්වාගෙන ගොස් තිබුණු බැංකු ගිණුමට 2021 පෙබරවාරි මාසයේ දී රු.391,655,000 ක මුදල් මාරු කර තිබුණි. මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත් 2021 වර්ෂයේ මාර්තු සිට 2021 නොවැම්බර් දක්වා ව්‍යාපෘති බැංකු ගිණුමට අදාල බැංකු ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම කාලය තුල බැංකු ගිණුම ක්‍රියාකාරී නොවූ බැවින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු ප්‍රකාශ හා බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණු රු.2,908,690 ක මුදල ප්‍රේෂණය නොකර ව්‍යාපෘති බැංකු ගිණුම වෙත චෙක්පත් තුනක් යටතේ නිකුත්කර තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුල පවත්වාගෙන ගිය Develop & Rehabilitation of Fishery Harbours Anchorages & Landing sites Project වියදම් දැරීම සඳහා 2020.12.31 දින වන විට ද ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම මත 2020.12.31 දිනට අතැති බිල්පත් ප්‍රමාණය රු. 385,182,274.82 ක් විය. 2020.12.31 දින රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රු.2,908,690ක මුදලක් වාර තුනක දී අග්‍රිම වශයෙන් ලබා දෙන ලද අතර එම අග්‍රිම මුදල් පොතට ඇතුලත් කර 2020.12.31 දින මුදල් පොත වසා දමන ලද බව. | ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලැසුම් කිරීම**

--------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------- | ------------ |
| (අ) ධීවර අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව මඟින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 9 ක් හඳුන්වා දී තිබුණ ද 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම, ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් හැර අනෙකුත් පහත සඳහන් කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර නොතිබුණි. තවද, | | |

| | | |
|---|---|---|
| උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යය වෙනුවෙන් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා තීරණ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට පමණක් කටයුතු කර තිබුණි. | | |
| (i) වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වාදීම. | ධීවර දෙපාර්තමේන්තුව යටතේ මත්ස්‍ය වාසස්ථාන ඉහළ නැංවීම සඳහා වෙරළබඩ කලාප සංවර්ධන දෙවන පියවරක් ලෙස මාතර නිල්වැල්ල ප්‍රදේශයේ ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ එක්ව සිදු කරන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සහ තෙවන පියවර යටතේ යාපනය මුහුදේ ඉවත දැමූ බස්රථ 38ක් ගිල්වා ඇති බව. | ප්‍රමුඛතා කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම. | ධීවර දෙපාර්තමේන්තුව මගින් නවීන තාක්ෂණය සහ නවීන මෙහෙයුම් ක්‍රමවේද සමඟ අංග සම්පූර්ණ යාත්‍රාවක් හඳුන්වාදීම සඳහා විශේෂඥ කමිටුවක් මගින් ව්‍යාපෘති වාර්තා සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බව. | -එම- |
| (iii) ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම. | 2021 වසරේ අයවැය ප්‍රතිපාදන වෙන් වී නොතිබුණු බව. | -එම- |
| (iv) නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම. | ධීවර සංස්ථාව මගින් මේ සඳහා විධිමත් ක්‍රියාත්මක සැලැස්මක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබුණු බව. | -එම- |
| (v) උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම. | උතුරු නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර | -එම- |

| | | |
|---|---|---|
| | ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවක් (Joint Working Group) පිහිටුවා ඇති බව. | |
| (vi) ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම. | 2021 වසර සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් වී නොතිබුණු බව. | -එම- |
| (vii) සාගර විශ්වවිද්‍යාලය භාවිතාකර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 2021 වසර සඳහා මෙම ව්‍යාපෘතියට මූලා‍ය ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවුණු බව. | -එම- |
| (ආ) සංවර්ධන සහායන් යටතේ ප්‍රාග්ධන මාරුකිරීම් වැය විෂයය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ටැබ් යන්ත්‍ර 110 ක් මිලදී ගැනීමට රු.8,514,000 ක් වැයකළ බව දක්වා තිබුණු නමුත් 2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව එවැනි මිලදී ගැනීමකට ප්‍රතිපාදන සලසා නොතිබූ බව නිරීක්ෂණය විය. | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති වාර්තාවට අනුව මෙම ව්‍යාපෘතීන් වෙනුවෙන් වෙන් කර ඇති මුදල රු.මිලියන 7 කි. එම මුදල හීන වූ මත්ස්‍ය ගහනය වර්ධනය කිරීම හා දැනට නෙලා නොගන්නා මසුන් වර්ග පිළිබඳ පර්යේෂණ සඳහා දත්ත ලබා ගැනීමේ කටයුතු විධිමත් කිරීම වෙනුවෙන් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් වෙත ටැබ් යන්ත්‍ර 110ක් මිලදී ගැනීමේ කාර්යය සඳහා යෙදවීමට අනුමැතිය සඳහා යවා ඇති බව. | ක්‍රියාකාරී සැලැස්ම අනුව යෝජිත ව්‍යාපෘතිවල ප්‍රතිපාදන අනුව කාර්යයන් සිදුකළ යුතුය. |
| (ඇ) ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ නව තාක්ෂණය හඳුන්වාදීමේ වැය විෂයය මඟින් නාරා ආයතනය විසින් රු.10,130,187 ක් වැය කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මට අනුව නව තාක්ෂණය හඳුන්වාදීම මඟින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට හා මසුන් නිෂ්පාදනයට වැය වන ගමන් කාලය අඩු කිරීමට හඳුන්වා දුන් තාක්ෂණ ක්‍රම පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය. | නාරා ආයතනය වෙත වෙන් කළ මුදල, මාතර ගාල්ල හා යාපනය යන දිස්ත්‍රික්කවල මත්ස්‍ය එක්රැස් කිරීමේ ඇටවුම් මුහුදේ තැන්පත් කිරීම සඳහා වෙන් කෙරුණු බවත් එය සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති බව. | -එම- |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය වෙත වෙන්කර තිබූ රු.10,000,000 ක ප්‍රතිපාදනයෙන් මත්ස්‍ය බිම් | 2021 වර්ෂයෙහි නව තාක්ෂණය වැය විෂයය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා | ක්‍රියාකාරී සැලැස්ම අනුව යෝජිත ව්‍යාපෘතිවල |

| | | |
|---|---|---|
| සොයාගැනීම සඳහා මෘදුකාංගයක් සැපයීමේ කාර්යය පමණක් රු.6,500,000 ක වියදමක් දරා ඉටුකර තිබුණි. 2021 වර්ෂය තුල අමාත්‍යාංශය සැලසුම් කරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ නාරා ආයතනය මඟින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු වෙරලාසන්න ධීවර මත්ස්‍ය බිම් 10 ක් සඳහා FAD සවිකිරීම්, පරිසර හිතකාමී අඩු ඉන්ධන, විකල්ප ඉන්ධන බලශක්ති සහිතව වැඩිදියුණු කළ යාත්‍රාවක් හඳුන්වාදීම, හීන වූ මත්ස්‍ය ගහනය ඉහළ නැංවීමට මසුන් තැන්පත් කිරීම සඳහා මසුන් වර්ග හා ප්‍රමාණයන් හඳුනාගැනීමේ පර්යේෂණ කටයුතු, වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩිකිරීම සඳහා අබලි වාහන භාවිතා කර ඇටවුම් යෙදවීම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය වෙත රු.මිලියන 60 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් වැය කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 39.2ක් වූ බව. | ප්‍රතිපාදන යොදා කාර්යයන් සිදුකළ යුතුය. |

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුකළ යුතු වුවත් 2019, 2020 හා 2021 වර්ෂවල නිකුත් කර තිබුණු විගණන විමසුම් 6 කට පිළිතුරු ලබා දී නොතිබුණි. | විමසුම් 06ක් ඉතිරි වී ඇති අතර අදාළ අංශවලින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කලපු 10 ක් හා වැව් 100 ක් සංවර්ධන කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ රු.මිලියන 1000 ක මුදලින් යන්ත්‍ර 03 ක් මිලට ගැනීම සඳහා රු.මිලියන 180 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණි. අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ ලංසුව කිසිම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේපකර වෙනත් ලංසුකරුවෙකුට ලංසුව ප්‍රදානය කර තිබුණද අදාල යන්ත්‍රය ලැබී නොතිබුණු හෙයින් අමාත්‍යාංශය විසින් ඉලක්ක කරන ලද කාර්යභාරය වර්ෂ 4 ක් ගතව ඇතත් ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | මෙම උපකරණය මිලදී ගැනීම සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ මෙම නිෂ්පාදනය නිර්දේශ කිරිමට හේතුන් පැහැදිලිව දක්වා ඇති බව. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (අ) | යන්ත්‍ර 03 ක් මිලදීගැනීම සඳහා සැපයුම්කරු විසින් ව්‍යාජ අත්තිකාරම් සුරක්ෂණ ඉදිරිපත් කර තිබූ අතර එලෙස වංචනිකව රජයේ මුදල් අවභාවිතා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට එරෙහිව පියවර හෝ සැපයුම්කරුට එරෙහිව කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණු අතර මුදල් රෙගුලාසි 705 ප්‍රකාරව සැපයුම්කරු අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මින් රජයට වූ සියළු අලාභයන් අය කර ගැනීමට කටයුතු කළ බවත් නීතිපති උපදෙස් අනුව සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාජ බැංකු සුරකුම් ලියවිලි අනුව ගිවිසුම ශූන්‍ය වීම මත සහ නියමිත ගිවිසුම්ගත කාලසීමා තුල සැපයුම්කරු විසින් භාණ්ඩ ලබා නොදීම මත දෙපාර්ෂව අතර ඇති කර ගත් ගිවිසුම අවසන් විය යුතු බවත් ඒ අනුව ගිවිසුම අවසන් කරන ලද බව. | අදාල නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම සහ සැපයුම්කරුට එරෙහිව නීතිමය පියවර ගත යුතු වීම. මුදල් රෙගුලාසි 705 ප්‍රකාරව සැපයුම්කරු අසාදු ලේඛනගත කිරීමට ද කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 ජුලි 03 දිනැති අංක 152/2018 දරන අත්තිකාරම් ගෙවීම් සහතිකයේ නිරවද්‍යතාවය අත්තිකාරම් මුදල ගෙවීමට පෙර තහවුරු කරගත යුතු වුවත් මාස 06 ක් ප්‍රමාද කර තිබුනු බැවින් ව්‍යාජ සහතිකයක් බව හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. | අත්තිකාරම් ගෙවීම් සහතිකයේ ව්‍යාජ බව දැනගත් විගස අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර අත්තිකාරම් ඇපකරයට අදාල මුදල පමණක් නොව, කාර්ය සාධන ඇපකරයට අදාල මුදල ද අධිකාරිය විසින් අයකර ගන්නා ලද බව. | අත්තිකාරම් මුදල ගෙවීමට පෙර අත්තිකාරම් ගෙවීම් සහතිකයේ නිරවද්‍යතාවය තහවුරු කරගත යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස්, ප්‍රසම්පාදන උපදෙස් හා මුදල් රෙගුලාසි හා නීතිපති ලබා දී ඇති උපදෙස් අනුව ඊට අදාළ ගිවිසුම සකස් කර නොතිබීම නිසා අදාල සැපයුම්කරුට එරෙහිව නිතිමය කටයුතු කිරීමට හැකියාව ලැබී නොතිබුණි. | භාණ්ඩ සැපයුම් සම්බන්ධයෙන් සම්මත ගිවිසුමක් වන අතර නීතිපතිගේ උපදෙස් අනුව අදාල ගිවිසුම අවසන් කළ බව. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | අමාත්‍යාංශයේ හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ද ඇතුලුව නිලධාරීන් 4 දෙනෙකු උක්ත උපකරණයේ ව්‍යුහගත සැලසුම්, භාවිතා කළ අමුද්‍රව්‍ය, අමතර කොටස් සහ එංජීම ආදී කරුණු පරීක්ෂා කිරීමට ඇමරිකා එක්සත් ජනපදයේ විදේශීය සංචාරයකට සහභාගි වීම වෙනුවෙන් රු.435,499 ක් ගෙවා තිබුණ ද අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | අදාල උපකරණයේ නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අභියාචනා කමිටු වාර්තාව අධ්‍යනය කිරිම තුලින් එය සනාථ කර ගත හැකි බව. | අදාල නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඉ) | ලංසු ලේඛනවල පොදු කොන්දේසි 1.2 ප්‍රකාරව උපකරණය නියමිත ප්‍රමිතියට නිපදවා තිබෙන බවත් නවතම නිර්මාණයක්වීමත් සහතික විය යුතු වුවත් තෝරාගනු ලැබූ ආයතනය ඉදිරිපත් කළ Ultra Tex WH 120 උපකරණය | ලංසු ලේඛනවල පොදු කොන්දේසි අනුව අදාල උපකරණය නියමිත ප්‍රමිතයට නිපදවා තිබෙන බවත්, නවතම නිර්මාණයක් බවත් නිෂ්පාදකයා විසින් සහතික කොට ඇති බවත් | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

මැලේසියාවේ නිෂ්පාදනයක් බව දක්වා තිබුණි. එහෙත් මැලේසියාවේ එම ආයතනයේ වෙබ් අඩවියට අනුව එවැනි උපකරණයක් නිෂ්පාදනය නොකරන බවත් එය ඇමරිකානු තාක්ෂණය අනුව නිෂ්පාදනය කරන ලද උපකරණයක් මැලේසියාවේ එකලස් කර නිෂ්පාදනය කරන බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ලංසු කොන්දේසිවලට පටහැනිව මෙම යන්ත්‍ර මිලටගැනීමට ලංසුකරු තෝරාගෙන තිබුණි.

මැලේසියාවේ නිෂ්පාදනයක් යන්න ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල තහවුරු වී නොමැති බවත් මේ පිළිබඳව ප්‍රසම්පාදන අභියාචන කමිටුවේ සටහන් සහ අදාල ඇමුණුම් මඟින් තහවුරු වී ඇති බව.